# බොදු ගිහි පිළිවෙත

පූජ්‍ය බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය
ස්ථවිරයන් වහන්සේ විසිනි.



ධර්මදානය සඳහා නොමිලයේ බෙද හරින පිණිසයි.

# බෞද්ධ ගිහි පිළිවෙත

බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය
ස්ථවිරයන් වහන්සේ විසිනි

ප්‍රකාශක :
මොඩන් පොත් සමාගම
නුගේගොඩ.

නිකුත් වූයේ :

ශ්‍රී බුද්ධ වර්ෂ 2532

ව්‍යවහාර වර්ෂ 1988

නුගේගොඩ හයිලෙවල් පාරේ අංක 198 දරණ ස්ථානයේ නිවැසි ඉන්ද්‍රා දේවිකා ගුණසේන විසින් එම ස්ථානයේ පිහිටි මොඩන් පොත් සමාගමට අයත් මොඩන් මුද්‍රණාලයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී

# සංඥාපනය

---

මෙය ඉන්ද්‍රා දේවිකා ගුණසේන මහත්මී විසින් අයදනා ලදුව කාටත් තේරුම් ගත හැකි ලිහිල් බසින් ලියන ලද කුඩා බණ පොතෙකි. බුදුරජාණන් වහන්සේ නොයෙක් අවස්ථාහි උපාසක උපාසිකාවන් කෙබඳු විය යුතු ද යන්න හෙළි කිරීම් වශයෙන් වදාළ දහම් කොටස් වල එකතුවෙකි. මෙය කියවා තේරුම් ගැන්ම, මෙය අනුව පිළිපැදීම බෞද්ධයනට සිය ජීවිතය සාර්ථක කැර ගැන්මට බොහෝ උපයෝගී වනු ඇත.

බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය ස්ථවිර

1988. 08. 07.

# බෞද්ධ ගිහි පිළිවෙත

මෙහි 'ගිහි පිළිවෙත' යනු බෞද්ධ ගිහි අය විසින් පිළිපැදිය යුතු හැටිය යි.

බුදුරජාණන් වහන්සේ ගේ ධරමාණ කාලයෙහි අද ව්‍යවහාරයෙහි පවතින 'බෞද්ධ' යන නම තුබුණේ නැත. මේ නම ව්‍යවහාරයට ආවේ බුදුපිරිනිවනින් සියවස් ගණනකටත් පසු ව ය. බුද්ධ කාලයෙහි 'බෞද්ධ' යන්න වෙනුවට ව්‍යවහාර වූයේ '(සරණගත) උපාසක' යන නම ය. පිරිමි අය 'උපාසක' නමින් ද ස්ත්‍රීහු 'උපාසිකා' නමින් ද හැඳින්වුණාහ. ඒ උපාසක උපාසිකාවන් විසින් පිළිපැදිය යුතු ප්‍රතිපත්තිය 'උපාසක ධම්ම, උපාසක පටිපත්ති' යනුවෙන් පෙළ අටුවාහි දක්වේ. එය අද ව්‍යවහාරයෙන් කියතොත් 'බෞද්ධ ප්‍රතිපත්ති' නමින් හැඳින්විය යුතු ය.

එහි ලා පළමු කොට 'බෞද්ධයා' හෙවත් 'උපාසකයා' නම් කවරේ ද ? යි දත යුතු යි. දවසෙක මහානාම ශාක්‍ය රජුට දහම් දෙසන භාග්‍යවතුන් වහන්සේ උපාසක ධර්ම විස්තර කළ සේක.

"කොපමණෙකින් උපාසකයෙක් (බෞද්ධයෙක්) වේ ද ?" යි මහානාම රජ ඇසී ය.

"මහානාමයෙනි, යමෙක් බුදුන් සරණ ගියේ වේ ද දහම් සරණ ගියේ වේ ද සංඝයා සරණ ගියේ වේ ද මෙ පමණින් හෙ තෙම උපාසක නම් වේ" යි බුදුරජාණන් වහන්සේ වදාළ සේක. මේ බුද්ධවචනයෙන් උපාසකයාගේ (බෞද්ධයාගේ) ලක්ෂණය දක්වීණ.

ඊ ළඟ ප්‍රශ්නය වූයේ ‘ ඔහුට උපාසක යන නම බැව-හර වනුයේ මොන අර්ථයක් (අදහසක්, තේරුමක්) උඩ ද?’ යන්න යි. “ බුදුරජුන් උපාසනය කරන හෙයින්, ධර්මය උපාසනය කරන හෙයින්, සංඝයා උපාසනය කරන හෙයින් හෙ තෙම උපාසක නම් වේ ” යි එයට දුන් උත්තරය යි.

මෙහි කී ‘ උපාසනය ’ නම් කිමෙක් ද ? ‘ උප ’ යනු ‘ ළං ව ’ යන අර්ථය දෙයි. ‘ ආසන ’ යනු ‘ ඉඳීම ’ ය. ‘ ආසක ’ යනු ‘ ඉඳින තැනැත්තා ’ ය. මෙසේ හෙයින් ‘ උපාසක ’ යනු බුදුරජුනට ධර්මයට සංඝයාට ඉතා ම ළං ව හොඳට ම කිට්ටුවෙන් ඉන්නා තැනැත්තා ය. මෙහි ළං ව ඉඳීම නම් ඒ තෙරුවනට සත්කාර ගරු බුහුමන කරමින් නිතර ආශ්‍රය කිරීම ය. මෙසේ වූ තැනැත්තා ශීලාදි ගුණදහම් රැකීමෙන් තෙරුවනට ළං වෙයි.

දුශ්ශීල වීම තෙරුවන කෙරෙන් ඈත් වීම ය. සත්ත්ව හිංසා, අන් සතු දෑ සොරා ගැනීම, කාමමිථ්‍යාචාර ආදි දුසිරිත් කිරීම, එයට අනුබල දීම තෙරුවන් දෙසට යෑම නො ව, තෙරුවන් ගෙන් ඈත් වීම ය.

සිල්වත් වීම තෙරුවනට ළං වීම ය. භාවනා වැඩීමෙන් තෙරුවනට වඩාත් ළං වෙයි.

මෙහි කී පරිදි අඹුදරුවන් රකිමින් ගිහි ගෙයි ඉන්නා උපාසක උපාසිකාවන් විසින් රැක්ක යුතු නිත්‍ය ශීලය කිමෙක් ද? වැරැදි පහෙන් වැළැකීම ය. එය “ මහානාමයෙනි, හෙ තෙම ප්‍රාණවධයෙන් වැළැක්කේ වේ නම්, අදත්තාදනයෙන් (අන් සතු දෑ අයුතු මගින් — සොරකමින්, බලාත්කාරයෙන්, බොරු නඩු මගින්,

පැහැරීමෙන්, වැළැක්කේ වේ නම්, කාමමිථ්‍යාචාරයෙන් වැළැක්කේ වේ නම්, මිථ්‍යාවචනයෙන් (බොරුකීමෙන්, කේලාම් කීමෙන්. පරුෂ වචනයෙන්, ප්‍රලාප දෙඩිල්ලෙන්) වැළැක්කේ වේ නම්, රහමෙර පානයෙන්, මත් ගතිය ඇති කරන, ප්‍රමාදයට කාරණ වන කෑම් පීම් ලේහ කිරීම් ආඝ්‍රාණය කිරීම් ආදියෙන් වැළැක්කේ වේ නම්, මෙ පමණින් උපාසකයා සිල්වතෙක් වේ''යැයි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

මෙ පන්සිල් නම් උපාසකයා (බෞඩයා) විසින් රැක්ක යුතු නිත්‍ය ශීලය යි. උපාසිකාවන් විසින් රැක්ක යුත්තේ ද මෙ පන්සිල් ම ය.

ඔහු කැමැත්තාහු නම්, හැකියාව තිබේ නම්, නිත්‍ය ශීල වශයෙන් දසසිල් ද රැක්ම අගනේ ය.

උපාසක උපාසිකාවන් විසින් අනෙකකු ගේ සහායත්වය නැති ව තනි ව ම මේ සිල් තම තමාට ද සමාදන් විය හැක්ක. වෙන කෙනකු කියවන ශික්‍ෂාපද අනුව කීමෙන් ද සමාදන් වියැ හැක්ක.

ශික්‍ෂා සියල්ල ම එකට හිතා ගෙන 'මම පන්සිල් සමාදන් වෙමි. දහසිල් සමාදන් වෙමි' යි කියා ද සමාදන් විය හැක්ක. එක් එක් ශික්‍ෂාපදය වෙන වෙන ම කීමෙන් ද සමාදන් වියැ හැක්ක. සියලු සික පද එකට හිතා ගෙන 'මම ශික්ෂාපද පස ම සමාදන් වෙමි' ආදීන් සමාදන් වීමෙ දී සිතේ ඇති වනුයේ එක් විරති චේතනා වෙකි. වෙන වෙන ම (ශික්ෂාපද එකක් එකක් පාසා කියමින්) සමාදන් වීමේදී ඒ හැම ශික්ෂා පදයක් පාසා විරති චේතනා වෙන වෙන ම ඇති වේ. මෙ

ශික්ෂා සමාදන් වීමේ දී වචනයෙන් එය කිය යුතු ය. ["සබ්බ සමාදනෙ පන වචීභෙදෙ කාතබ්බො යෙව. (අංගුත්තර ටීකා 457)].

උපාසකයා ගේ (බෞඩයා ගේ) ආජීවය - ජීවත්වීමට ධන උපයන මඟ කවරේ ද? යි ඇසූ ප්‍රශ්නයට භාග්‍යවතුන් වහන්සේ වදළේ "පංචිමා වණිජ්ජා උපාසකෙන අකරණීයා" යනුයෙන් "උපාසකයා (බෞඩයා) විසින් නො කටයුතු වෙළෙඳම් පසෙකැ" යි වදළ සේක. ඒ පස නම්: මිනිසුන් විකිණීම (වහල් වෙළෙඳම), (යුඩාදියට ගන්නා) ආයුධ වෙළෙඳම් කිරීම, මැරීමට සතුන් විකිණීම හෝ සතුන් මරා මස් විකිණීම, මද්‍යවර්ග විකිණීම යන මේ වෙළෙඳම් පසින් ද සූදුවෙන් ද මෙ බඳු ම වූ නානාවිධ අධර්මයෙන්, අල්ලස් ගැනුම් ආදියෙන් ද ධනය නො ම හම්බ කළ යුතු යි.

අධර්මයෙන් ධනය හම්බ කිරීමට නිදර්ශනයක් දක්වෙයි. කිසිවෙක් අනෙකකු යටතේ හෝ රජයේ රැකියාවකට බැඳෙයි. දවසකට පැය හතක් වැඩ කළ යුතුය. ඒ ගණනට දෙනු ලබන වැටුප (පඩිය) මෙ පමණ යැ යි නියමයෙක් ද ඇත. එය පිළිගෙන දිනපතා කාර්‍යාලයයට යයි. මාසය අවසානයේ වැටුප ලබා ගනී. සමහර දින වල හෙ තෙම සම්පූර්ණ පැය ගණන වැඩ නො කොට පැය තුන හතරක් වැඩ කොට ඉතිරි හරිය යාළුවන් මිතුරන් හා කතාබස් කරමින් හෝ වෙන එ බඳු අන් ක්‍රියාවෙක යෙදෙමින් කාලය ගෙවයි. එහෙත් මාසය අවසානයේ ඔහු වැටුප් ගන්නේ නියමිත පූර්ණ කාලයේ වැඩ කළ කෙනකු හැටියට ය. එය වංචාවෙකි. හෙතෙම ධාර්මික ව ධන උපයන්නෙක් නම් තමා වැඩ නො කළ පැය ගණන දන්වා වැඩ කළ පැය ගණනට සරිලන වැටුප

ධර්මයෙන් ගත යුතු ය. ධනය හම්බ කරන නොයෙක් අධර්ම මාර්ග ඇත. ඒ නොදැහැමි මඟින් වෙන් ව, දැහැමි මඟින් ම ධනය සැපැයිය යුතු ය.

උපාසකයා ගේ (බෞද්ධයා ගේ) උපාසක භාවය (බෞද්ධ කම) වැනසෙන දෑ කවරේ ද? ඔහුගේ හෝ ඇගේ සිල් බිඳී යෑ ම ද, අධර්මයෙන් ධන සැපයීම ද උපාසකභාව විපත්තියට (බෞද්ධ කම නැසෙන) මඟ වේ.

තව ද උපාසක චණ්ඩාලයකු වීම, උපාසක මලයක් (මලකඩ උපාසකයකු) වීම, පිළිකුල් උපාසකයකු වීම යන හැම එකක් ම උපාසක භාවය (බෞද්ධ කම) විනාශ වීමට හේතු වේ.

එහි උපාසක චණ්ඩාලයකු (රොඩී බෞද්ධයකු) වනුයේ කෙසේ ද?

"පංචහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො උපාසකො උපාසකචණ්ඩාලො ච හොති උපාසකමලො ච උපාසකපතිකිට්ඨො ච හොති."

"මහණෙනි, කරුණු පසෙකින් යුත් උපාසකයා (බෞද්ධයා) උපාසක චණ්ඩාලයෙක්, උපාසක මලකඩෙක්, නින්දිත උපාසකයෙක් වෙයි."

"කතමෙහි පංචහි? . . . . . . ."

කවර පසින් යුතු තැනැත්තේ ද? යත්: ශ්‍රද්ධාව නැත්තේ වේ ද, දුශ්ශීල වේ ද, කෝතුහල මංගලික වේ ද, කර්මවිපාක ධර්මය නො පිළිගනී ද, සුබාසුබ නිමිති අදහා ද, මේ

බුදුසසුනෙන් පිටාතර, අන්‍ය ලබ්ධික පැවිද්දන් අතුරෙහි දක්ෂිණාර්හයන් සොයයි ද, ඔවුන් කෙරෙහි පළමුවෙන් සත්කාර ගුරුකාර කෙරේ ද මෙකී කරුණු පසින් යුතු තැනැත්තේ උපාසක චණ්ඩාල (රොඩී බෞද්ධයෙක්) ද, උපාසක මලකඩයෙක් (මලකඩ බෞද්ධයෙක්) ද, නින්දිත නීච උපාසකයෙක් (නීච බෞද්ධයෙක්) ද වෙයි.

මෙහි කෝතුහල මංගලික බව ද උපාසක බවට හානිකර යැ යි දක්වීණ. පෙර නිමිතිවල බලයෙන් සුබ හෝ අසුබ වෙතැ යි විශ්වාස කරන බව මෙයින් අදහස් කරන ලදී. කර්මානුරූප ව සිදු වන දෑයට පෙර නිමිති පහළ වෙතැ යි පිළිගැන්ම සුදුසු ය. වරද වනුයේ පෙරනිමිත්තේ බලයෙන් සුබාසුබ වෙතැයි සිතා ගැන්ම ය. මේ වැරැදි පිළිගැන්ම ඇති අය පෙර මහට නො සතුට උපදවන කෙනකු දැක කාලකන්නියෙකැ යි කුපිත වේ. ඔහුට නපුරු වචනයෙන් බණී. ඒ ගමන අසුබ කිරීමේ බලයෙක් ඒ මිනිසා තුළ නැත. විපතක් වෙන්නට යතොත් ඔහුගේ කුශල ඵලයෙකින් හෝ ආරක්ෂක දේවතානුග්‍රහයෙන් එයින් ඔහු මුද ගැන්මට අසුබ නිමිති ඇති වේ.

බුදුරජුනට හෝ බුදුදහමට හෝ බුදුරජුන්ගේ ආර්‍යශ්‍රාවක සංඝයාට හෝ වැඩි තරම් උතුම් කෙනෙක් ඇතැයි සැබෑ උපාසක (බෞද්ධයා) නො පිළිගනී. මෙයින් අන්‍ය සමයයන්හි ගුණවත් අය නැතැ යි යන අදහසෙක් නො පැවැසේ. අන්‍ය සමයවල ද කොපමණ වත් ගුණවත් අය ඇත. ඒ සමයවල ද හොඳ ඉගැන්වීම් ඇත. එහෙත් ආත්මවාද නිර්මාණවාදාදි මිථ්‍යාවන් පිළිගැන්ම නිසා ඔවුන් ගේ ගුණවත් බවේ අගය පහත බැස ඇත. ආර්‍ය

ශ්‍රාවක සංඝයාට වඩා උසස් ගුණවතෙක් හෝ මෙ සසුනැ දක්වෙන ශීල සමාධි ප්‍රඥා විමුක්ති යන ධර්මවලට වඩා උසස් දහමෙක් ඒ කිසිවෙක නැත. ඇතැ යි ගතොත් එයින් ම ඔහුගේ උපාසක බව (බෞද්ධ කම) සිදී යෙයි.

" පංචහි ධම්මෙහි සමන්නාගතො උපාසකො විසාරදො හොති. කතමෙහි පංචහි ? පාණාතිපාතා පටිවිරතො හොති . . . . සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති " යනුවෙන්, ප්‍රාණවධාදි පස් පවෙන් වැළැකුණු උපාසකයා (බෞද්ධයා) විශාරද (බිය සැක නැත්තෙක්) වෙයි. තමා ප්‍රාණවධාදි පාපයන් ගෙන් වැළැකී ඉන්නා බැවිනි.

මෙයින් පස්පවෙන් වැළකුණු සැබෑ බෞද්ධයා බිය සැක නැති එඩිතර කෙනකු බවත් ඒ පව් කරන අය බිය සැක ඇත්තවුන් බව දක්වෙයි.

" පංචහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො උපාසකො උපාසකරතනං ච හොති උපාසකපදුමං ච උපාසක පුණ්ඩරිකං ච " යන්නෙන්, ශ්‍රද්ධාදි කරුණු පසෙකින් යුත් උපාසකයා (බෞද්ධයා) උපාසකරත්නයෙක් ද උපාසක පද්මයෙක් (නෙළුම් මලක් බඳු ගුණසුවඳැති උපාසකයෙක්) ද, උපාසක පුණ්ඩරීකයෙක් (හෙළ පියුමක් බඳු උපාසකයෙක්) ද වෙයි.

ඒ කවර කරුණු පසින් යුත් උපාසකයා (බෞද්ධයා) ද ? යත් : සැදැහැවත් වෙයි. කෝතූහල මංගලික (දුටු ඇසූ ආදි දෑයේ බලයෙන් සුබාසුබ වෙතැ යි යන දෘෂ්ටියෙන් යුක්ත) නො වෙයි. කර්ම ශක්තිය පිළිගනී. මෙ සසුනෙන්

පිටතැ දක්ෂිණාර්හයන් නො සොයයි. ඔවුන් කෙරෙහි ප්‍රථම සත්කාර ගුරුකාර නො කරයි. මේ ඒ කරුණු පසයි.

මහානාම රජ උපාසකයා ගේ (බෞඩයා තුළ ඇති) ආත්මහිත පරහිත ප්‍රතිපත්තිය (තමාටත් අනුනටත් දියුණුව සලසන පිළිවෙත) කිමෙක් දැ ? යි ඇසූ ප්‍රශ්නයට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක :

" උපාසකයා (බෞඩයා) තෙමේත් ශ්‍රඩාව භක්තිය ඇති ව අන්‍යයනුත් ශ්‍රඩා භක්ති ඇත්තවුන් කරයි. තෙමේ සිල්වත් වැ අනුනුත් සිල්වතුන් කරයි (සිල් රක්නට අනුනුත් උනන්දු කරයි. එයට මඟ සලසයි). තෙමේ ත්‍යාගවත් වැ අනුනුත් ත්‍යාගවතුන් කරයි (තෙමේ සිල්වතුන් දක්නා කැමැත්තේ අනුනුත් දක්නා කැමැත්තන් කෙරෙයි. තෙමේ බණ අහනු කැමැත්තේ, අනුනට ද බණ අසන්නට සලස්සයි. තෙමේ අසාගත් බණ හිතේ තබා ගනුයේ අනුනට ද ඇසූ බණ අමතක නොකර හිතේ තබා ගැන්මට උනන්දු කරවයි. තෙමේ ද සිතැ තබාගත් බණ පදවල අදහස නුවණින් සලකා බලන්නා හා ම අනුන් ලවා ද එය කරවයි. තෙමේ ඒ බණපද ඉගෙන ඒවායේ අදහස් ද තේරුම් ගෙන එය අනුව පිළිවෙත් පුරනුයේ, අනුන් ලවා ද එය කරවයි. මෙසේ (සැබෑ) උපාසකයා තමාගේ යහපත පිණිස ද අනුන් ගේ යහපත පිණිස ද පිළිපන්නේ වෙයි." (අංගුත්තරනිකාය 748 පිට)

තව ද,

" දස්සනකාමො සීලවතං සඩම්මංසොතු මිච්ඡති
විනෙයාා මච්ඡෙරමලං ස වෙ සඩො'හි වුච්චති "

සිල්වතුන් දක්නා කැමැත්ත, බණදහම් අසනු කැමැත්ත, මසුරු මල දුරු කොට ත්‍යාගවත් ව වසන බව යන අංග තුන ශ්‍රද්ධාවතා හැඳින ගැන්මේ ලකුණු යි.

මෙකී ගුණවලින් ඈත් වූ තරමට උපාසකයා (බෞද්ධයා) බෞද්ධ කමින් ඈත් වේ.

"සත්තිමෙ භික්ඛවෙ ධම්මා උපාසකස්ස පරිහානාය සංවත්තන්ති. කතමෙ සත්ත ? භික්ඛුදස්සනං හාපෙති, සද්ධම්මසවණං පමජ්ජති, අධිසීලෙ න සික්ඛති, අප්පසාද බහුලො හොති භික්ඛුසු ථෙරෙසු නවකෙසු මජ්ඣිමෙසු ච, උපාරම්භචිත්තො ධම්මං සුණාති රන්ධගවෙසී, ඉතො ච බහිද්ධා දක්ඛිණෙය්‍යං ගවෙසති, තත්‍ථ ච පුබ්බකාරං කරොති. ඉමෙ ඛො සත්ත ධම්මා භික්ඛවෙ උපාසකස්ස පරිහානාය සංවත්තන්ති." — (අංගුත්තර, සත්තක)

මෙයින් දැක්වෙන පරිදි උපාසකයා (බෞද්ධයා) බෞද්ධ ගුණ කෙරෙන් පිරිහීමට හේතු වන කරුණු සතෙකි. ඒ සත නම් : "භික්ෂූන් දක්නට නො යෑම, බණ ඇසීමට ඕනෑ කමක් නැති බව, පන්සිල් අටසිල් දසසිල් නම් වූ උතුම් සිල් නො රැකීම, සිල්වත් වූ බාල මහලු මධ්‍යම භික්ෂූන් කෙරෙහි පැහැදීමක් නැති බව (බොහෝ සෙයින් මසුරුබව, මිසදිටුවන් ඇසුරු කිරීම ආදිය මෙයට හේතු වේ), දොස් සොයන අදහසින් බණ ඇසීම, මේ බුදුසසුනෙන් පිටත්හි දක්ෂිණාර්හයන් සෙවීම, පළමුවෙන් ඔවුනට ගෞරව සත්කාර කොට පසු ව භික්ෂූන් දෙස බැලීම" යන මේවා ය.

"යස්ස කස්සචි සද්ධා නත්ථි කුසලෙසු ධම්මෙසු හිරි . . . ඔත්තප්පං . . . විරියං . . . පඤ්ඤා නත්ථි කුසලෙසු ධම්මෙසු අයං වුච්චති අරියස්ස විනයෙ දළිද්දො." — (අංගුත්තර, 552 පිට)

ගුණදහම් වැඩීමෙහි ශ්‍රද්ධාව නැති බව, පවට ලජ්ජා බය නැති කම, අකුසලින් වැළැකීමෙහිත් කුසල් වැඩීමෙහිත් උත්සාහ නැති කම, ප්‍රඥාව නැති කම හෙවත් ආධ්‍යාත්මික ධන හත නැති කම දිළිඳුකමෙකි. උපාසකයාට (බෞද්ධයාට) මහත් ම පිරිහීමෙකි.

## උපාසකයා ගේ (බෞද්ධයා ගේ) පින් වැඩෙන ක්‍රියා

"කෙසං දිවා ච රත්තො ච සදා පුඤ්ඤං පවඩ්ඪති? ධම්මට්ඨා සීලසම්පන්නා කෙ ජනා සග්ගගාමිනො? ආරාමරොපා වනරොපා, යෙ ජනා සෙතුකාරකා පපං ච උදපානං ච, යෙ දදන්ති උපස්සයං"

(සංයුත්තනිකාය, 18 පිට)

දවසෙක කෙනෙක් බුදුරජාණන් වහන්සේ වෙත අවුත් ප්‍රශ්නයක් ඇසූහ.

ප්‍රශ්නය :

රෑ දවල් දෙකේ හැම කල්හි ම පින් වැඩෙන්නේ කාගේ ද? මරණින් මතු සවර්ගයට යන දැහැමි සිල්වත්තු කවුරු ද?

උත්තරය :

"මල්වතු පලතුරු වතු වවන්නන්, සෙවණ ගෙන දෙන වවන්නන්, කෙනකු නොවවා තමන් ම වැවුණු කැලෑවලට රකවල් සලසා භාවනානුයොගීනට වාසය පිළියෙල කරන්නන්, හේදඬු පාලම් කරන්නන්, ළින්

වැස වස් අවසානයේ දී ශ්‍රාවක රහතුන් හැට නමක් දහම් දෙසනු පිණිස හැට අතකට යැවූ සේක. ඒ සැට නම අතුරෙන් පංචවර්ගික භික්ෂූන් ගෙන් කෙනෙක් වූ මහානාම රහත් තෙරණුවෝ මගධ රට මච්ඡිකාසණ්ඩ නුවරට වැඩියාහ. චිත්‍ර ගෘහපතියා උන්වහන්සේ ගේ ඉරියව්වෙහි පැහැද සිය ගෙට වැඩම කරවා බොජුනින් සංග්‍රහ කොට ඉක්බිති තමා ගේ අම්බාටකාරාම නම් උයනට වැඩම කරවා ගෙන ගියේ ය. එහි වාසය පිළියෙල කැරවී ය. දිනපතා ම බොජුන් පිණිස තමාගෙ ගෙට වඩින ලෙසට අයැදී ය. හැම ද ම බණ අසන්නට යන සිටුහට තෙරණුවෝ බණ වදරති. සවල්ප කලෙකින් චිත්‍ර ගෘහපති අනාගාමී ඵලයට පැමිණියේ ය. කලකට පසු සිටු තුමා බුදුරජුන් දක්නට යනුවෝ ගැල් පන් සියයෙක දන් කළමනා පටවා ගෙන දෙදහසක් පමණ පුරුෂයන් කැටුව නික්මුණේ ය. භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ අඩමසක් පමණ බුදුරජුනටත් එක්දස් දෙසිය පනහකටත් වැඩි තරම් වූ සියලු භික්ෂුසංඝයාටත් දිනපතා ම දන් දුන්නේ ය. දෙවියන් ගෙන් ද රජගහනුවර වැසියන් ගෙන් ද හැම සැටියෙන් චිත්‍ර ගෘහපති තෙම මහත් සත්කාර ලැබී ය. ඔහු ලත් මහත් සත්කාර ගැන මහ ජනයා අතර කථා උපන. එය අසා භාග්‍යවතුන් වහන්සේ,

"සද්ධො සීලෙන සම්පන්නො යසොභොගසමප්පිතො
යං යං පදෙසං භජති තත්‍ථ තත්‍ථෙව පූජිතො" යි

"සැදැහැ ඇති සිල්වත් පොහොසත් තැනැත්තා කොහෙ සිටියත් මහජනයා ගෙන් ගරු බුහුමන් සත්කාර ලැබුයෙක් වේ" යැ යි වදාළ සේක. මේ චිත්‍ර ගෘහපති තුමා මාර්ගඵල ලත් මහත් ගිහි බෞද්ධ පිරිසක් සමග

හැසුරුණේ ය. මෙ තෙම හොඳට ධර්මය ඉගෙන ඇසුරු කරන්නනට බණ කීමෙහි ද යෙදුණේ ය. පසු කලෙක භාග්‍යවතුන් වහන්සේ ඔහු ධර්මකථික උපාසකවරුන් අතුරෙහි (ගිහි බෞද්ධයන් අතුරෙහි) අග්‍ර ම තැනැත්තා යැ යි අගතන්හි තැබූ සේක.

## හත්‍ථකාලවක රජ

භාග්‍යවතුන් වහන්සේ අළවු රට වැඩ ආළවක යකුට බණ වදරා උපාසක බව්හි පිහිටුවූ සේක. එද ඔහුට බිලි පිණිස අළවු රජු එවූ ළදරු රජ කුමරුවා අළවු යක් තෙම බුදුරජුන් ගේ අතෙහි තැබී ය. බුදුරජු නැවැත අළවු යකුගේ අත්හි තැබී ය. හෙ තෙම අළවුරජුගේ (දරුවා ගෙනා) රාජපුරුෂයන් ගේ අත්හි තැබී ය. ඔහු ගෙනවුත් අළවු රජුට බාරදුන්හ. අතින් අතට ගිය බැවින් හේ හත්‍ථක නම් විය. අළවු රටට අයත් බැවින් ආළවක නම් විය. මෙසේ හෙ තෙම හත්‍ථකාළවක නමින් ප්‍රසිද්ධ විය. හේ වැඩුණේ පිය රජු ඇවෑමෙන් එ රටේ රජ විය. පසු කලෙක භාග්‍යවතුන් වහන්සේ එහි වැඩ දෙසූ දහම් අසා විපස්සනා වඩා අනාගාමී විය. හෙ තෙමෙ යටකී චිත්‍ර ගෘහපතියා සේ ම නිතර ආර්යශ්‍රාවක උපාසක වරුන් මහ පිරිසක් විසින් ඇසුරු කරනු ලබයි.

බුදුරජුන් එහි වැඩි වතාවෙක හෙ තෙම සිය පන්සියයක් පමණ වූ තමා ගේ උපාසක පිරිස කැටුව අවුත් භාග්‍යවතුන් වහන්සේ වැඳ පසෙක ඉඳගත්තේ ය. ඔහු ගේ සුවිනීත වූ පිරිස බලා භාග්‍යවතුන් වහන්සේ "ආළවකයිනි, මේ මහ පිරිසට තෙපි කෙසේ සංග්‍රහ කරවූ ද ?" යි අසා වදාළ සේක.

'' වහන්ස, ආහාර පානාදි අවශ්‍ය ද ලබනු කැමැති-යනට ඒ ද දෙමි. ප්‍රිය වචන බලාපොරොත්තු වන අයට ප්‍රිය වචනයෙන් සංග්‍රහ කරමි. තමන් ගේ වැඩ කටයුතු කර කියා ගැන්මට මගෙන් උදවු බලාපොරොත්තු වන අයට ඒ අතින් උදවු දෙමි. මා සමග එකට සමාන ලෙස ඉඳගැනුම් ආදිය රිසි අයට මට සමාන ලෙස ම පවත්නට සලස්වමි '' යි කී ය.

පසු කලෙක භාග්‍යවතුන් වහන්සේ සතර සංග්‍රහ වස්තුයෙන් පිරිසට සංග්‍රහ කරන්නන් අතුරෙහි හත්‍ථක ආළවක රජ අග්‍ර යැ යි අග තන්හි තුබූ සේක.

උපාසකවරුන් (ගිහි බෞඩයන්) විසින් චිත්‍ර ගෘහපතියා මෙන් හොඳ ගුණවත් අය ගේ ආශ්‍රය ඇති බණ දහම් උගත්, ඒ උගත් ධර්මය ඇසුරු කරන අයට උගන්වන ත්‍යාගවත් කෙනකු විය යුතු යැ යි ද, හත්‍ථකාළවක රජු මෙන් හොඳ ගුණවත් පිරිසක ගේ ම ආශ්‍රය ඇති දන, ප්‍රියවචන, අර්ථචර්යා, සමානාත්මතා යන සතර සංග්‍රහ වස්තුවෙන් ඇසුරු කරන අයට සංග්‍රහ කරන කෙනකු වියැ යුතු යැ යි ද, මේ දෙදෙනා සේ ම මේ ජීවිතයෙහි දී ම මාර්ගඵල ලැබීමට උත්සාහවත් වියැ යුතු යැ යි ද ආදර්ශ ගත යුතු.

උපාසිකාවන් විසින් (බෞඩ ස්ත්‍රී පක්‍ෂය විසින්) ඛුජ්ජුත්තරා උපාසිකාව ද වෙළුකණ්ටකී නන්‍දමාතෘ ද ආදර්ශයට ගත යුතු යැ යි කියන ලදී.

ඛුජ්ජුත්තරා නම් කවරී ද ? යත් :

බුදුරජුන් දවස කොසොඹෑ නුවර රජය කැරවූ උදෙනි රජුහු ගේ බිසවක වූ සාමාවතී දේවිය ගේ උපස්ථායිකා වූ ඛුජ්ජුත්තරා නම් ස්ත්‍රියක් සිටියා ය. දවසෙක ඕ සිරිත් පරිදි සාමාවතිය විසින් දෙන ලද කහවණු

අට රැගෙන මල් මිළයට ගනු පිණිස මල්කරු ගේ ගෙදෙරට ගියා ය. ප්‍රධාන මල්කරු ඇය දැක, " අම්මා, දැන් උඹට මල් දෙන්නට අවකාස පහසු නැහැ. බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ කොටැති සංඝයාට දන් පිළිගන්වන වෙලාව යි මේ. උඹත් ඇවිත් මෙ දන් පිළිගැන්වීමට උදවු වෙයන් " යැ යි කී ය. ඕ ද ගොස් බොජුන් හලෙහි දන් වළඳන බුදුපාමොක් සඟනට වතාවත් කළා ය. බුදුරජුන් දන් වළඳ අවසනැ වදළ තාක් ධර්‍මකථාව සිත තබා ගත්තා ය. භුත්තානුමෝදනා දේශනාව කෙළවර දී සෝවාන් වූවා ය.

එදයින් පළමු දවස්වල ඇය ගෙනෙන කහවණු අටෙන් සතරක් තමා වෙත තබා ගනී, කහවණු සතරක මල් පමණක් ගෙන යයි. සෝවාන් වූ අය එබඳු වැරදි නො කරත්. එබැවින් එද ඕ කහවණු අටට ම මල් ලබා ගෙන එයින් කූඩය පුරවා ගෙන ගොස් සාමාවතිය අතට දුන්නා ය.

" අම්මා, උඹ වෙනද ගෙනෙන්නෙ නෑ මෙච්චර මල්. අද කොහොම ද මෙච්චර ගොඩක් මල් ගෙනාවේ ?" යැ යි සාමාවතී ඇසුවා ය.

ඛුජ්ජුත්තරා ඇත්ත ම කීවා ය. පෙර තමා කළ වංචාව හෙළි කොට, " අද බුදුරජුන් වදළ බණ අසා අමා මහ නිවන් දිටිමි. මෙ තැන් සිට වංචා ලෙස කිසිත් නො කරමි " යි ඕ කීවා ය. සාමාවතී ප්‍රමුඛ ඇගේ පිරිවර ස්ත්‍රීහු ද ඛුජ්ජුත්තරාව බුදුරජුන් ගෙන් අසා උගත් ධර්‍මය ඉගෙන ගන්නට කැමැති වූහ. ධර්‍මයට ගරු කළ යුතු බැවින් උස් අස්නක් පණවා සාමාවතී ආදින් මිටි අසුන්හි හිඳ බණ ඇසිය යුතු යැ යි ඕ කීවා ය. මේ එද

පැවැති ශිෂ්ට චාරිත්‍ර ය. ඔහු ද එසේ කළහ. ඛුජ්ජුත්තරා උස් අස්නැ හිඳ බණ කීවා ය. සෙස්සෝ මිටි අසුන්හි හිඳ බණ ඇසූහ. බණ අවසනැ සාමාවතී සහිත ඒ සියලු ස්ත්‍රී පිරිස සෝවාන් වූහ.

එ තැන් සිට සාමාවතී දේවී ඛුජ්ජුත්තරා මෙහෙකරු කමින් ඉවත් කොට තමාගේ ගුරු තන්හි තබා ඇයට සත්කාර කළා ය. හැම ද ම බුදුරජුන් වෙත ගොස් බණ අසා ඉගෙන අවුත් තමනට එය කියන ලෙසට ඉල්ලූහ. ඕ ද එය කළා ය. පසු කලෙක භාග්‍යවතුන් වහන්සේ බහුශ්‍රැත උපාසිකාවන් අතුරෙන් ඛුජ්ජුත්තරා අග්‍රයැ යි අග තන්හි තැබූ සේක.

වෙළුකණ්ටක පුර වුසූ නන්‍දමාතෘ උපාසිකාව ගිහිගෙහි වුසුවා ද බඹසර රැක්කා ය. ධ්‍යාන වඩා සෘද්ධි මත් වූවා ය.

බෞද්ධ ස්ත්‍රී පුරුෂ දෙ පස ගිහි ව හිඳ ම බෞද්ධ භාවයෙන් උසස් පල ලබනු රිස්සෝ නම් චිත්‍ර ගෘහපති, හත්‍ථාළවක රජ, ඛුජ්ජුත්තරා උපාසිකා, වෙළුකණ්ටකී නන්‍දමාතෘ යන උපාසක උපාසිකාවන් බඳු විය යුතු.

ග. ආරියපාල ගුණසේන මහත්මාට
නිවන් සැප ලැබේවා!

මෙම දහම් පොත ධර්මදානයක් ලෙස බෙදහැරීමේ පින පරලෝසැපත් ආදරණීය ග. ආරියපාල ගුණසේන මහත්මාට නිවන් සැපත ලැබීමට හේතු වේවා යි පතමි.

දේවිකා ගුණසේන

මොඩන්-නුගේගොඩ